# වාර්ෂික කාර්ය සාධන වාර්තාව

# 2014

**ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව,**

**අංක 9, පිලිප් ගුණවර්ධන මාවත,**

**කොළඹ 07**

### ➢ දැක්ම

ක්‍රීඩාව තුළින් ආසියාවේ අභිමානවත් ජාතියක් බවට පත්වීම

### ➢ මෙහෙවර

ක්‍රීඩාවේ යටිතල පහසුකම් සහ මානව සම්පත් සංවර්ධනයට අදාල උපාය මාර්ගික මෙහෙයුම් ක්‍රියාවට නැගීම තුළින් ක්‍රීඩා සංස්කෘතියක් බිහිකිරීමත්, නීරෝගී විනය ගරුක ක්‍රීඩාවේ විශිෂ්ඨයන් බිහි කිරීමත් මඟින් රටේ සංවර්ධනය ළඟා කර ගනිමින් ශ්‍රී ලංකාව ආසියාවේ අභිමානවත් ජාතියක් බවට පත් වීම

### ➢ හැඳින්වීම

60 දශකයේ මැද භාගයේ දී කුඩා ඒකකයක් ලෙස ආරම්භ කරන ලද ක්‍රීඩා සංවර්ධනය 1966 දී ජනසතු සේවා අමාත්‍යාංශය යටතේ ක්‍රීඩා අංශයක් ලෙස ස්ථාපිත කරන ලදී. 1968 දී ක්‍රීඩා දෙපාර්තමේන්තුව ආරම්භ කරන ලද අතර 1970 දී ක්‍රීඩා විෂයය භාර අමාත්‍යාංශයක් වශයෙන් පාර්ලිමේන්තු කටයුතු හා ක්‍රීඩා අමාත්‍යාංශය පිහිටුවා ක්‍රීඩා දෙපාර්තමේන්තුව ඒ යටතට ගනු ලැබීය.

1989 දී යෞවන කටයුතු හා ක්‍රීඩා අමාත්‍යාංශය යටතේ ක්‍රියාක්මක වී 1996 දී ඒ ශ්‍රේණියේ දෙපාර්තමේන්තුවක් බවට උසස් විය. 2000 දී සංචාරක හා ක්‍රීඩා අමාත්‍යාංශය යටතේ ද, 2003 දී තරුණ කටයුතු හා ක්‍රීඩා අමාත්‍යාංශය යටතේ හා 2004 සිට ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශය යටතටත්, 2007 දී ක්‍රීඩා හා පොදු විනෝදාත්මක කටයුතු අමාත්‍යාංශය යටතේ ද, 2010 සිට ක්‍රීඩා අමාත්‍යාංශය යටතේ ද ක්‍රීඩාව වෙනුවෙන් සුවිශේෂී වූ කාර්යභාරයක් ඉටු කරමින් ක්‍රියාත්මක වේ.

**කාර්යභාරය**


1. මානව සම්පත් සංවර්ධනය
   - ක්‍රීඩක ක්‍රීඩිකාවන් සඳහා විධිමත් පුහුණුවක් ලබා දීම
   - ක්‍රීඩක ක්‍රීඩිකාවන් දේශීය හා ජාත්‍යන්තර තලයේ ක්‍රීඩා තරඟවලට යොමු කිරීමට අවශ්‍ය පසුබිම සකස් කිරීම
   - ක්‍රීඩා පුහුණුකරුවන්ට හා නිලධාරීන්ට විදේශ පුහුණුව ලබා දීම
   - විදේශ පුහුණුකරුවන් මගින් ශ්‍රී ලාංකික පුහුණුකරුවන් පුහුණු කිරීම
   - ක්‍රීඩා නිලධාරින්ට නව තාක්ෂණය හඳුන්වා දීම සඳහා වැඩමුළු සංවිධානය කිරීම
   - දේශීය හා විදේශීය ක්‍රීඩා විශේෂඥයන් ලවා ක්‍රීඩා නිලධාරීන්ට හා පුහුණුකරුවන්ට ක්‍රීඩා සම්මන්ත්‍රණ පැවැත්වීම
   - දේශීය හා විදේශීය ක්‍රීඩා අධ්‍යාපන ශිෂ්‍යත්ව පිරිනැමීම

## 2. යටිතල පහසුකම් සංවර්ධනය

- ජාත්‍යන්තර තරඟ සඳහා යෝග්‍ය ක්‍රීඩා සංකීර්ණ ඇති කිරීම
- ජාතික හා දිස්ත්‍රික් මට්ටමින් ක්‍රීඩාංගණ සංවර්ධනය කිරීම හා නවීකරණය කිරීම
- ග්‍රාමීය ක්‍රීඩා පිටි සංවර්ධනය
- ක්‍රීඩා භාණ්ඩ හා උපකරණ සැපයීම

මෙම කාර්යභාරයන් ඉටු කිරීම සඳහා 2014 වර්ෂය තුළ දී දෙපාර්තමේන්තුව වෙත ලැබී ඇති ප්‍රතිපාදන ප්‍රමාණය හා වර්ෂය අවසාන වන විට ලබා ඇති ප්‍රගතිය පහත දැක්වේ.

| වැය විෂයය | 2014 වාර්ෂික ප්‍රතිපාදන (රු.මි) | 2014.12.31 දිනට සමුච්චිත වියදම (රු.මි) | වියදම් ප්‍රතිශතය % |
|---|---|---|---|
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්** | | | |
| මූලධන | 16.70 | 0.306 | 2 |
| පුනරාවර්තන | 132.80 | 121.131 | 91 |
| **සංවර්ධන ක්‍රියාකාරකම්** | | | |
| මූලධන | 1684.50 | 1045.004 | 62 |
| පුනරාවර්තන | 388.60 | 255.162 | 66 |
| **එකතුව** | **2222.60** | **1421.603** | **64** |



# 1. මානව සම්පත් සංවර්ධනය

## 1.1. ජාතික මහා ක්‍රීඩා උළෙල

දිවයිනේ පළාත් මට්ටමින් තෝරා ගනු ලැබූ ක්‍රීඩක ක්‍රීඩිකාවන් ජාතික තලයට කැඳවා දක්ෂයින් හඳුනා ගැනීම සහ එම දක්ෂතා ඔප් නැංවීමට අවස්ථාව ලබා දෙමින් ජාත්‍යන්තරතලයට යොමු කිරීම අරමුණු කොට ගෙන වාර්ෂිකව මෙම උළෙල පවත්වනු ලබයි.

2014 වර්ෂයේ දී 40 වන ජාතික මහා ක්‍රීඩා උළෙල අනුරාධපුර පළාත් ක්‍රීඩා සංකීර්ණයේ දී පවත්වන ලදී. මෙම ක්‍රීඩා උළෙල සාර්ථකව පැවැත්වීම සඳහා රුපියල් මිලියන 47.601 ක් වැය කර ඇත.

**2014 වර්ෂයේ ජාතික මහා ක්‍රීඩා උළෙලේ සමස්ත පදක්කම් පළාත් අතර බෙදී ගිය අයුරු**

| අංකය | පළාත | පදක්කම් | | | එකතුව |
|---|---|---|---|---|---|
| | | රන් | රිදී | ලෝකඩ | |
| 1. | බස්නාහිර | 75 | 54 | 57 | 186 |
| 2. | මධ්‍යම | 37 | 38 | 39 | 114 |
| 3. | දකුණ | 23 | 32 | 34 | 89 |
| 4. | වයඹ | 24 | 21 | 38 | 83 |
| 5. | උතුරු මැද | 16 | 19 | 37 | 72 |
| 6. | සබරගමුව | 14 | 23 | 27 | 64 |
| 7. | නැගෙනහිර | 06 | 03 | 16 | 25 |
| 8. | ඌව | 08 | 09 | 18 | 35 |
| 9. | උතුර | - | 04 | 10 | 14 |
| එකතුව | | **203** | **203** | **276** | **682** |

# 40 වන ජාතික මහා ක්‍රීඩා උළෙලේ දී පිහිටුවන ලද නව තරග වාර්තා

| අංකය | ක්‍රීඩාව | ඉසව්ව | බර පංතිය | ක්‍රීඩකයාගේ නම | පළාත | දක්ෂතාවය | |
|---|---|---|---|---|---|---|---|
| | | | | | | ශ්‍රී ලංකා | තරග කාලය |
| 01 | පිහිනුම් (පිරිමි) | මීටර් 50 ලය ආර | - | කනිත මුණසිංහ | බස්නාහිර | - | තත්.31:40 |
| 02 | | මීටර් 200 පසු ආර | - | චන්දුල ප්‍රනාන්දු | බස්නාහිර | - | වි. 2:18.93 |
| 03 | | මීටර් 200 නිදහස් ආර | - | දිලංක ශිහාන් | බස්නාහිර | - | වි. 2:00.45 |
| 04 | | මීටර් 100 පසු ආර | - | චන්දුල ප්‍රනාන්දු | බස්නාහිර | - | වි. 1:01.38 |
| 05 | | මීටර් 100 නිදහස් ආර | - | කේ.පී.එස්.බී ද සිල්වා | මධ්‍යම | - | තත්.53.52 |
| 06 | පිහිනුම් (කාන්තා) | මීටර් 50 ලය ආර | - | ඩබ්.කේ.ගිහාරා සචිනි අමරසිංහ | දකුණු | - | තත්. 37:29 |
| 07 | | මීටර් 100 නිදහස් ආර | - | අමන්දා ජයසේකර | බස්නාහිර | - | වි.1:03:97 |
| 08 | | මීටර් 200 මෙඩ්ලි තරගය | - | ඩී.හිරුෂි ද සිල්වා | බස්නාහිර | - | වි. 2:41.42 |
| 09 | | මීටර් 800 නිදහස් ආර | - | ඉෂානි සේනානායක | බස්නාහිර | - | වි.10:21.90 |

## 1.2. ක්‍රීඩා ශක්ති වැඩසටහන

ක්‍රීඩා කුසලතාවලින් හෙබි වයස අවුරුදු 15–20 ත් අතර ක්‍රීඩක ක්‍රීඩිකාවන් දිස්ත්‍රික් මට්ටමින් තෝරා ගැනීමත්, විද්‍යානුකූලව විධිමත් පුහුණුවක් ලබා දීම හා ක්‍රීඩා පුහුණුකරුවන් සඳහා අවශ්‍ය වන මූලික පහසුකම්, උපදෙස්, දැනුම, ආකල්ප හා කුසලතා ලබා දීම තුළින් ලොව ජය ගත හැකි ක්‍රීඩක ක්‍රීඩිකාවන් බිහි කිරීමට අවශ්‍ය පරිසරයක් නිර්මාණය කිරීම මෙම වැඩ සටහනේ මූලික අරමුණ වේ.

ජාතික වැඩ සටහනට සහභාගි වන ක්‍රීඩක ක්‍රීඩිකාවන් සඳහා ආහාර, නවාතැන්, ගමන් වියදම් හා රු.1,500/=ක පෝෂණ දීමනාවක් ද, සංචිතගත ක්‍රීඩක ක්‍රීඩිකාවන් සඳහා රු.2,500/=ක පෝෂණ දීමනාවක් ද, සියලුම ක්‍රීඩක ක්‍රීඩිකාවන් සඳහා ඇඳුම්, පාවහන් හා හිස් වැසුම් ලබා දේ.

මෙයට අමතරව මෙම වැඩ සටහන සාර්ථක කර ගැනීම සඳහා සහභාගි වන ජාතික මට්ටමේ පුහුණුකරුවන්ට රු.5,000/=, සහාය පුහුණුකරුවන්ට රු. 2,500/=, පළාත් පුහුණුකරුවන්ට රු.2,000/=, පෞද්ගලික පුහුණුකරුවන්ට රු. 1,000/= බැගින් මාසික දීමනාවක් ද ලබා දේ.

මෙම වසර තුළ දී රුපියල් මිලියන 27.855 ක වැය දැරීමකින් මෙම වැඩ සටහන නිම කරන ලදී.








## 1.3. 2014 වර්ෂය තුළ දී ලබාගත් ජාත්‍යන්තර තරඟ ජයග්‍රහණ

| අංකය | ක්‍රීඩාව | තරගාවලිය | පැවැත්වූ රට | පදක්කම් | | |
|---|---|---|---|---|---|---|
| | | | | රන් | රිදී | ලෝකඩ |
| 01 | වෙරළ වොලිබෝල් | තුන්වන ලුසෆෝනියා තරගාවලිය | ඉන්දියාව | - | 02 | 01 |
| 02 | මේසපන්දු | තුන්වන ලුසෆෝනියා තරගාවලිය | ඉන්දියාව | - | 01 | 02 |
| 03 | මළල ක්‍රීඩා | විවෘත ජවන හා පිටිය ශුරතාවලිය | තායිලන්තය | 06 | 05 | 01 |
| | | 16 වන ආසියානු කණිෂ්ඨ මළල ක්‍රීඩා තරගාවලිය | චීනය | - | 02 | 01 |
| | | තුන්වන ලුසෆෝනියා තරගාවලිය | ඉන්දියාව | 04 | 04 | 05 |
| | | 91 වැනි මැලේසියානු මළල ක්‍රීඩා තරගාවලිය | මැලේසියාව | 03 | 02 | - |
| | | සිව් වන බෘනායි විවෘත මළල ක්‍රීඩා තරගාවලිය | බෘනායි | 07 | - | - |
| 04 | පා පන්දු | තුන්වන ලුසෆෝනියා තරගාවලිය | ඉන්දියාව | - | - | 01 |
| 05 | ජූඩෝ | තුන්වන ලුසෆෝනියා තරගාවලිය | ඉන්දියාව | - | - | 01 |
| 06 | වූෂු | තුන්වන ලුසෆෝනියා තරගාවලිය 2014 | ඉන්දියාව | 03 | 02 | 01 |
| | | 06 වන ලෝක සාම්ප්‍රදායික වූෂු තරගාවලිය | චීනය | 01 | 01 | 03 |
| 07 | බර ඉසිලීම | 20 වන පොදු රාජ්‍ය මණ්ඩලීය ක්‍රීඩා උළෙල | ස්කොට්ලන්තය | - | 01 | - |
| 08 | තයිකොන්ඩෝ | තුන්වන ලුසෆෝනියා තරගාවලිය | ඉන්දියාව | - | 01 | 03 |
| 09 | බැඩ්මින්ටන් | 2 වන යොවුන් ඔලිම්පික් තරගය | චීනය | - | - | 01 |
| | | උගන්ඩා ජාත්‍යන්තර බැඩ්මින්ටන් තරගාවලිය | උගන්ඩාව | 01 | - | - |

| අංකය | ක්‍රීඩාව | තරගාවලිය | පැවැත්වූ රට | පදක්කම් | | |
|---|---|---|---|---|---|---|
| | | | | රන් | රිදී | ලෝකඩ |
| 10 | කායවර්ධන | 68 වන ලෝක ශූරතා තරගාවලිය | බ්‍රසීලය | - | - | 01 |
| | | ආසියානු කායවර්ධන ශූරතාවය | ශ්‍රී ලංකාව | 04 | 03 | 02 |
| 11 | ක්‍රිකට් | විස්සයි විස්ස ලෝක කුසලාන ක්‍රිකට් තරගාවලිය | බංග්ලාදේශය | 01 | - | - |
| | | ආසියානු ක්‍රීඩා උළෙල | දකුණු කොරියාව | 01 (පිරිමි) | - | 01 (කාන්තා) |
| 12 | බොක්ෂිං | ඇගොන්ග්ස් කුසලාන බොක්ෂිං තරගාවලිය | මලයාසියාව | - | 01 | 01 |
| | | ලයන්ස් කුසලාන බොක්ෂිං තරගාවලිය | | 05 | 01 | - |
| 13 | බාස්කට්බෝල් | දකුණු ආසියානු බාස්කට්බෝල් ශූරතාවය | | - | 01 | - |
| 14 | තුන් ප්‍රයාම | ජාත්‍යන්තර තුන් ප්‍රයාම තරගාවලිය | ඉන්දුනීසියාව | - | 01 | - |
| 15 | වෝටර් පෝලෝ | මලයාසියානු ජාතික වෝටර් පෝලෝ ශූරතාවය | මලයාසියාව | - | - | 01 |
| 16 | කරාතේ | කරාතේ ලෝක විවෘත කණිෂ්ඨ තරගය | ඉන්දියාව | 01 | - | - |




**සුදේශ් පීරිස් - පොදු රාජ්‍ය මණ්ඩලීය ක්‍රීඩා උළෙල බර ඉසිලීම - රිදී පදක්කම**



**සචින් ඩයස් - බැඩ්මින්ටන් ලෝකඩ පදක්කම**

## 14 පුහුණු කඳවුරු

**දිස්ත්‍රික්ක පුරා විසිරී සිටින සහජ ක්‍රීඩා දක්ෂතා සහිත දරු දැරියන් හඳුනා ගෙන ඔවුන් දක්ෂතා පෙන්වන ක්‍රීඩාවනට යොමු කොට ඔවුන්ගේ කුසලතා වර්ධනයට ඉවහල් වන පරිදි ජාතික මට්ටමේ දී බාහිර පුහුණුකරුවන් මගින් පුහුණුව ලබා දෙමින්, අඛණ්ඩ පුහුණුව ලබා දීම සඳහා දිස්ත්‍රික් පුහුණු මධ්‍යස්ථාන වෙත යොමු කිරීමත්, ඒ ඒ වයස් කාණ්ඩවලට අදාල දක්ෂ ක්‍රීඩක ක්‍රීඩිකාවන් ක්‍රීඩා ශක්ති වැඩ සටහනට යොමු කරලීමත් මෙම වැඩ සටහනේ අරමුණ වේ.**

**එක් දිස්ත්‍රික්කයක් සඳහා මාසිකව රු.25,000 ක මුදලක් ලබා දෙන අතර එක් මසකට එක් ක්‍රීඩාවක් වෙනුවෙන් පුහුණු කඳවුරු පැවැත්වේ.**

**දිවයිනේ දිස්ත්‍රික්ක 25 ම ආවරණය වන පරිදි මළල ක්‍රීඩා, වොල්බෝල්, නෙට්බෝල්, බොක්ෂිං, කබඩි, වෙරළ වොලිබෝල්, කාන්තා ක්‍රිකට්, හොකී, රගර්, ජුඩෝ, පිහිණුම්, පාපැදි, පාපන්දු, මේස පන්දු, ජල ක්‍රීඩා, ත්‍රෝබෝල්, මල්ලව පොර, තයිකොන්ඩෝ, ජිම්නාස්ටික්, බැඩ්මින්ටන්, බර එසවීම, පැසිපන්දු, ක්‍රිකට්, කරාටේ යන ක්‍රීඩා වෙනුවෙන් පුහුණු කඳවුරු පවත්වා ඇති අතර ක්‍රීඩක ක්‍රීඩිකාවන් 8692 ක් මේ සඳහා සහභාගි වී ඇත. මේ වැඩ සටහන සඳහා රුපියල් මිලියන 11476 ක් වැය දරා ඇත.**



ගාල්ල කබඩි පුහුණු කඳවුර



මාතලේ මලල ක්‍රීඩා පුහුණු කඳවුර



පුත්තලම මලල ක්‍රීඩා පුහුණු කඳවුර

# 1.5. මානව සම්පත් කළමනාකරණය

## 1.5.1. 2014 වර්ෂයේ මුළු සේවක බඳවා ගැනීම්

| අංකය | නව පත්වීම් | පුරුෂ | ස්ත්‍රී | එකතුව |
|---|---|---|---|---|
| 01 | නිත්‍ය සේවය | 19 | - | 19 |
| 02 | කොන්ත්‍රාත් / අනියම් | 02 | - | 02 |
| **එකතුව** | | **21** | **-** | **21** |

## 1.5.2. 2014 වර්ෂයේ සේවයෙන් ඉවත්වීම් සහ ස්ථාන මාරුවීම්


| අංකය | සේවයෙන් ඉවත් වීම් | පුරුෂ | ස්ත්‍රී | එකතුව |
|---|---|---|---|---|
| 01 | විශ්‍රාම යාම් සංඛ්‍යාව | 07 | - | 07 |
| 02 | සේවය / ගිවිසුම් කාලය සම්පූර්ණ වීම ( කොන්ත්‍රාත් / අනියම් ආදී සේවකයින්) | - | - | - |
| 03 | සේවයෙන් ඉල්ලා අස්වීම් සංඛ්‍යාව | - | - | - |
| 04 | ස්ථාන මාරුවීම් ( ශුද්ධ) | 02 | 01 | 03 |
| 05 | සේවය අත්හිටුවීම් සංඛ්‍යාව | - | - | - |
| 06 | වෙනත් | - | - | - |
| 07 | ඉවත්ව යන මුළු සේවක සංඛ්‍යාව | 09 | 01 | 10 |

## 1.5.3. 2014.12.31 දිනට කාර්ය මණ්ඩල විස්තර

| අංකය | තනතුර | වැටුප්තලය | සේවක සංඛ්‍යාව | | |
|---|---|---|---|---|---|
| | | | අනුමත | සිටින | පුරප්පාඩු |
| 01 | අධ්‍යක්ෂ ජනරාල් (ශ්‍රී.ලං.ප.1 විශේෂ) | SL 1 | 01 | 01 | - |
| 02 | අධ්‍යක්ෂ (පාලන) (ශ්‍රී.ලං.ප.1) | SL 1 | 01 | - | 01 |
| 03 | අධ්‍යක්ෂ (සැලසුම්) (ශ්‍රී.ලං.ක්‍ර.1) | SL 1 | 01 | 01 | - |
| 04 | අධ්‍යක්ෂ (ඉංජිනේරු) (ශ්‍රී.ලං.ඉ.1) | SL 1 | 01 | 01 | - |
| 05 | ප්‍රධාන ගණකාධිකාරි (ශ්‍රී.ලං.ග. 1) | SL 1 | 01 | - | 01 |
| 06 | අධ්‍යක්ෂ (ක්‍රීඩා) (දෙපා. 1) | SL 1 | 01 | - | 01 |

| අංකය | තනතුර | වැටුප්තලය | සේවක සංඛ්‍යාව | | |
|---|---|---|---|---|---|
| | | | අනුමත | සිටින | පුරප්පාඩු |
| 07 | නියෝජ්‍ය/සහකාර අධ්‍යක්ෂ(පාලන) (ශ්‍රී.ලං.ප.11/111) | SL 1 | 01 | 01 | - |
| 08 | ගණකාධිකාරි (ශ්‍රී.ලං.ග. 11/111) | SL 1 | 02 | - | 02 |
| 09 | ඉංජිනේරු (ශ්‍රී.ලං.ඉ.11/111) | SL 1 | 01 | 01 | - |
| 10 | නියෝජ්‍ය / සහකාර අධ්‍යක්ෂ(ක්‍රීඩා) (දෙපා. 11/111) | SL 1 | 04 | 01 | 03 |
| 11 | සහකාර අධ්‍යක්ෂ(ක්‍රීඩා) (දෙපා. 111) | MN 7 | 01 | - | 01 |
| 12 | අභ්‍යන්තර විගණක | SL 1 | 01 | - | 01 |
| 13 | කලමණාකරණ සහකාර (අධි පන්තිය) | MN 7 | 01 | - | 01 |
| 14 | භාෂා පරිවර්තක | MN 6 | 01 | 01 | - |
| 15 | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරි | MN 6 | 01 | - | 01 |
| 16 | සංවර්ධන නිලධාරි (දෙපාර්තමේන්තුගත) | MN 4 | 04 | 02 | 02 |
| 17 | මානව සම්පත් සංවර්ධන සහකාර (දෙපාර්තමේන්තුගත) | MN 4 | 01 | 01 | - |
| 18 | සංවර්ධන නිලධාරි (නව) | MN 4 | 55 | 33 | 22 |
| 19 | සැලසුම් හා වැඩ සටහන් සහකාර (දෙපාර්තමේන්තුගත) | MN 4 | 02 | 02 | - |
| 20 | වැඩ සටහන් නිලධාරි | MN 3 | 01 | 01 | - |
| 21 | දිස්ත්‍රික් ක්‍රීඩා නිලධාරි | MN 3 | 01 | 01 | - |
| 22 | ව්‍යාපෘති නිලධාරි | MN 3 | 18 | 05 | 13 |
| 23 | ක්‍රීඩා පුහුණුකරු | MN 3 | 103 | 88 | 15 |
| 24 | ක්‍රීඩා නිලධාරි | MN 3 | 40 | 35 | 05 |
| 25 | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර | MT 4 | 01 | 01 | - |
| 26 | කලමණාකරණ සහකාර (පංතිය 1/11/111) | MN 2 | 23 | 15 | 08 |
| 27 | තාක්ෂණ නිලධාරි | MN 2 | 02 | - | 02 |
| 28 | නිවාස පාලක | MN 1 | 02 | - | 02 |
| 29 | සහකාර නිවාස පාලක | MN 1 | 01 | 01 | - |
| 30 | රියදුරු සේවය (පංතිය 1,11අ/11 ආ) | PL 3 | 12 | 10 | 02 |
| 31 | අරක්කැමි | PL 1 | 01 | 01 | - |
| 32 | සහකාර අරක්කැමි | PL 1 | 02 | 02 | - |
| 33 | කා.සේ. සේ (1/11/111) | PL 1 | 12 | 23 | අතිරික්ත 11 |
| 34 | ක්‍රීඩා භූමි සහායක | PL 1 | 25 | 13 | 12 |
| එකතුව | | | **325** | **238** | **73** |

## 1.5.4. සංවිධාන ව්‍යුහය



## 1.6. මානව සම්පත් සංවර්ධනය

### 2014.01.01 දින සිට 2014.12.31 දින දක්වා දෙපාර්තමේන්තු නිලධාරින් සහභාගි වූ පුහුණු වැඩ සටහන් ...

| අංකය | පුහුණු වැඩ සටහනේ නම | සහභාගී වූ සංඛ්‍යාව |
|---|---|---|
| 01 | ප්‍රසම්පාදන කළමනාකරණය සහ ඉදිකිරීම් පිළිබඳ උසස් සහතික පත්‍ර පාඨමාලාව | 01 |
| 02 | පොත් බැඳුම්කරු පුහුණුව | - |
| 03 | Information Communication Technology Technician(ICTT) | 02 |
| 04 | ගබඩා කළමනාකරණය හා වාර්ෂික තොග ගණන් ගැනීම | 03 |
| 05 | සේවා ස්ථානයේ ඉහළ ඵලදායීතාවයක් පවත්වාගෙන යාම සඳහා කාල කළමනාකරණය | 01 |
| 06 | මූලික ඉංග්‍රීසි පුහුණු පාඨමාලාව | 02 |
| 07 | වැන්දඹු/ වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් | 02 |
| 08 | ගිණුම් ලිපිකරුවන්ගේ කාර්ය භාරය හා වගකීම | 03 |
| 09 | ප්‍රවාහන කළමනාකරණය | 01 |
| 10 | පුද්ගලික ලිපි ගොනුවක් පවත්වාගෙන යාම | 03 |
| 11 | කොන්ත්‍රාත් පරිපාලනය, ගෙවීම් කිරීමේ ක්‍රියා පටිපාටිය සහ කොන්ත්‍රාත් ලිපිගොනු නඩත්තුව | 01 |
| 12 | නිවාඩු ලිපිකරුවන්ගේ කාර්ය භාරය | 02 |
| 13 | අලාභ වාර්තා කිරීම, හානි පූර්ණය හා කපා හැරීම | 03 |
| 14 | 5S For Productivity Enhancement | 03 |
| 15 | රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ නිලධාරීන්ගේ කළමනාකරණ සහකාර පරිචය | 01 |
| 16 | ක්‍රීඩාවේදී ජයග්‍රහණ ලබන්නේ කෙසේද? | 76 |
| 17 | සංවර්ධන නිලධාරීන් සඳහා වූ පුහුණු වැඩමුළුව | 32 |
| 18 | කාර්යාල කළමනාකරණයේ මූලික අංග | 35 |
| 19 | දෙමළ භාෂා පුහුණුව | 25 |
| 20 | මාර්ග නීති සහ රථ වාහන කළමනාකරණය | 12 |
| 21 | ආකල්ප සංවර්ධනය | 95 |
| 22 | විනය කළමනාකරණය | 95 |
| 23 | රැකියාව සහ ජීවිතය උදෙසා සංගීතය | 95 |

# 2. යටිතල පහසුකම් සංවර්ධනය

**2.1 ප්‍රධාන සංවර්ධන ව්‍යාපෘතීන් හි 2014 වර්ෂයේ ප්‍රගතිය පහත පරිදි සාරාංශ කර දැක්විය හැක.**

| අංකය | ව්‍යාපෘතියේ නම | 2014 වර්ෂය සඳහා ප්‍රතිපාදන | 2014.12.31 දිනට වියදම | වියදම් ප්‍රතිශතය |
|---|---|---|---|---|
| 01 | ග්‍රාමීය ක්‍රීඩාපිටි සංවර්ධනය | 19.75 | 13.998 | 71% |
| 02 | දිස්ත්‍රික් පුහුණු මධ්‍යස්ථාන වැඩි දියුණු කිරීම | 20.00 | 7.292 | 36% |
| 03 | ග්‍රාමීය ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ ක්‍රීඩා කෞශල්‍යය වැඩි දියුණුකිරීමේ ව්‍යාපෘතිය | 380.00 | 207.919 | 55% |
| 04 | රීඩ් මාවත ක්‍රීඩා සංකීර්ණය | 75.00 | 53.931 | 72% |
| 05 | ටොරින්ටන් ක්‍රීඩා සංකීර්ණය | 50.00 | 42.316 | 85% |
| 06 | පාසල් ක්‍රීඩාංගන නවීකරණය | 32.00 | 16.838 | 53% |
| 07 | කැගලු විද්‍යාලය/තෝලංගමුව ක්‍රීඩාංගනය සංවර්ධන ව්‍යාපෘතිය | 40.00 | 40.00 | 100% |
| 08 | පළාත් හා දිස්ත්‍රික් ක්‍රීඩා සංකීර්ණ ඉදිකිරීම | 1020.00 | 646.802 | 63% |
| 09 | නුවර එළිය තුරඟ තරඟ පිටිය ක්‍රීඩා සංකීර්ණය නවීකරණය | 1.00 | 0.00 | 0% |
| 10 | එළියරංගු ක්‍රීඩා පිටිය නවීකරණය | 10.00 | 10.00 | 100% |
| 11 | ක්‍රීඩා ශක්ති වැඩසටහන | 80.00 | 27.855 | 35% |

### 02.1.1. ක්‍රීඩා සංකීර්ණ ඉදිකිරීම

දිවයින පුරා සෑම පළාතක් සඳහාම ජාත්‍යන්තර පහසුකම්වලින් සමන්විත පළාත් ක්‍රීඩා සංකීර්ණයක් ඉදිකිරීමටත්, එසේම පළාත් ක්‍රීඩා සංකීර්ණ ඉදි නොකෙරෙන දිස්ත්‍රික් ආවරණය කිරීම සඳහා දිස්ත්‍රික් ක්‍රීඩා සංකීර්ණ ඉදිකිරීමටත් 2011 දී අමාත්‍ය මණ්ඩල සංදේශයකින් අනුමැතිය ලබා ඇත.

## 02.1.1.1. පළාත් ක්‍රීඩා සංකීර්ණ ඉදිකිරීම

2011 දී ආරම්භ කළ ක්‍රීඩා සංකීර්ණ අතුරින් බදුල්ල හා අනුරාධපුර ක්‍රීඩා සංකීර්ණ මහජන අයිතියට පවරා ඇති අතර 2015 දී කිලිනොච්චි ජාතික ක්‍රීඩා සංකීර්ණය සහ මහනුවර දිගන ක්‍රීඩා සංකීර්ණය අවසන් කිරීමට නියමිතය.

| අංකය | පළාත් ක්‍රීඩා සංකීර්ණයේ නම | පළාත | ඇස්තමේන්තු ගත මුදල (රු.මි) | 2014 වාර්ෂික ප්‍රතිපාදන (රු.මි) | 2014.12.31 දිනට සමුච්චිත වියදම (රු.මි) |
|---|---|---|---|---|---|
| 1 | බදුල්ල වින්සන්ට් ඩයස් ක්‍රීඩා සංකීර්ණය | ඌව පළාත | 347.00 | 75.00 | 214.825 |
| 2 | අනුරාධපුර මහජන ක්‍රීඩා සංකීර්ණය | උතුරු මැද පළාත | 270.78 | 48.00 | 263.274 |
| 3 | දිගන කුණ්ඩසාලේ දිස්ත්‍රික් ක්‍රීඩා සංකීර්ණය | මධ්‍යම පළාත | 212.00 | 30.00 | 226.720 |
| 4 | කිලිනොච්චිය දිස්ත්‍රික් ක්‍රීඩා සංකීර්ණය | උතුරු පළාත | 224.82 | 14.00 | 219.975 |
| 5 | ත්‍රිකුණාමලය මැකේෂයර් ක්‍රීඩා සංකීර්ණය | නැගෙනහිර පළාත | 324.00 | 150.00 | 144.287 |
| 6 | රත්නපුර මහජන ක්‍රීඩා සංකීර්ණය | සබරගමු පළාත | - | 50.00 | - |





ඉදිකිරීම් අවසන් කළ අනුරාධපුර මහජන ක්‍රීඩාංගනය ජනතා අයිතියට පවරමින්...

## 02.1.1.2. දිස්ත්‍රික් ක්‍රී ඩා සංකීර්ණ ඉදිකිරීම

පළාත් ක්‍රීඩා සංකීර්ණ ඉදි කිරීම මඟින් ආවරණය නොවන දිස්ත්‍රික් සඳහා අංග සම්පූර්ණ පහසුකම් සහිත දිස්ත්‍රික් ක්‍රීඩා සංකීර්ණ ඉදි කරනු ලබයි.

- **ඉදිකිරීම් ආරම්භ කර ඇති දිස්ත්‍රික් ක්‍රීඩා සංකීර්ණ.**

| අංකය | දිස්ත්‍රික් ක්‍රීඩා සංකීර්ණයේ නම | දිස්ත්‍රික්කය | ඇස්තමේන්තු මුදල (රු.මි) | 2014 වාර්ෂික ප්‍රතිපාදන (රු.මි) | 2014.12.31 දිනට සමුච්චිත වියදම (රු.මි) |
|---|---|---|---|---|---|
| 1 | මාතර දිස්ත්‍රික් ක්‍රීඩා සංකීර්ණය | මාතර | 233.27 | 147.84 | 183.371 |
| 2 | බණ්ඩාරගම දිස්ත්‍රික් ක්‍රීඩා සංකීර්ණය | කළුතර | 212.03 | 111.74 | 167.839 |
| 3 | පොළොන්නරුව දිස්ත්‍රික් ක්‍රීඩා සංකීර්ණය | පොළොන්නරුව | 120.65 | 90.65 | 41.341 |
| 4 | පුත්තලම දිස්ත්‍රික් ක්‍රීඩා සංකීර්ණය | පුත්තලම | 181.71 | 116.00 | 127.768 |
| 5 | මඩකලපුව දිස්ත්‍රික් ක්‍රීඩා සංකීර්ණය | මඩකලපුව | 199.21 | 108.04 | 148.225 |
| 6 | අම්පාර දිස්ත්‍රික් ක්‍රීඩා සංකීර්ණය | අම්පාර | 186.404 | 148.64 | 88.211 |

- **2015 වර්ෂයේ දී ඉදිකිරීම් ආරම්භ කිරීමට නියමිත දිස්ත්‍රික් ක්‍රීඩා සංකීර්ණයන්..**

| අංකය | දිස්ත්‍රික් ක්‍රීඩා සංකීර්ණයේ නම | දිස්ත්‍රික්කය | ඇස්තමේන්තු මුදල (රු.මි) |
|---|---|---|---|
| 1 | මන්නාරම එමිල් නගර් මහජන ක්‍රීඩාංගනය | මන්නාරම | 175.00 |
| 2 | කෑගල්ල මහජන ක්‍රීඩාංගනය | කෑගල්ල | 175.00 |
| 3 | ගාල්ල දඩල්ල ක්‍රීඩා සංකීර්ණය | ගාල්ල | 175.00 |
| 4 | මාතලේ දිස්ත්‍රික් ක්‍රීඩා සංකීර්ණය | මාතලේ | 175.00 |
| 5 | වවුනියාව දිස්ත්‍රික් ක්‍රීඩා සංකීර්ණය | වවුනියාව | 175.00 |
| 6 | මුලතිව් දිස්ත්‍රික් ක්‍රීඩා සංකීර්ණය | මුලතිව් | 175.00 |
| 7 | ගම්පහ දිස්ත්‍රික් ක්‍රීඩා සංකීර්ණය | ගම්පහ | 175.00 |

## 3. වැය විස්තරය

**විසර්ජන ගිණුම - 2014**
**වියදම් ශීර්ෂ අංකය - 219**

| | (1) | (2) | (3) | (4) | (5) | (6) |
|---|---|---|---|---|---|---|
| වාර්ෂික ඇස්තමේන්තුවෙහි සඳහන් පරිදි වැඩ සටහනෙහි නම | අයවැය ඇස්තමේන්තු වෙන් කිරීම | අතිරේක ප්‍රතිපාදන හා අතිරේක ඇස්තමේන්තු වෙන් කිරීම | මු.රෙ. 66 සහ 69 අනුව මාරු කිරීම | මුළු ශුද්ධ වෙන් කිරීම (1+2+3) | මුළු වියදම | ශුද්ධ ප්‍රතිඵලය ඉතිරිය/ඉක්මවීම (4-5) |
| රුපියල් | | | | | | |
| පුනරාවර්තන | | | | | | |
| මෙහෙයුම් වැඩ සටහන | 127,150,000 | 0 | 0 | 127,150,000 | 122,371,141 | 4,778,859 |
| සංවර්ධන වැඩ සටහන | 384,000,000 | 0 | 0 | 384,000,000 | 288,719,399 | 95,280,601 |
| **උප එකතුව (පුනරාවර්තන)** | 511,150,000 | 0 | 0 | 511,150,000 | 411,090,540 | 100,059,460 |
| මූලධන | | | | | | |
| මෙහෙයුම් වැඩ සටහන | 16,650,000 | 0 | 0 | 16,650,000 | 285,030 | 16,364,970 |
| සංවර්ධන වැඩ සටහන | 1,726,355,000 | 0 | 0 | 1,726,355,000 | 1,133,281,219 | 593,073,781 |
| **උප එකතුව (මූලධන)** | 1,743,005,000 | 0 | 0 | 1,743,005,000 | 1,133,566,249 | 609,438,751 |
| **සම්පූර්ණ එකතුව** | **2,254,155,000** | **0** | **0** | **2,254,155,000** | **1,544,656,789** | **709,498,211** |